**මුලතිව් දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 11 - 2023**

**-------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා එකොළහක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තරාත්මක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 11 ට අදාළ 2023 වර්ෂයේ නිකුත් කර තිබුණ විගණන වාර්තා 11 හි කාරක සභා 02ක් සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් සහ කාරක සභා 09ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණ අතර තත්ත්වාගණනය කළ මතයන් සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 06ක් විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගබඩාවේ තිබූ සහනාධාර පොහොර තොග ටොන් 291.16ක වටිනාකම රු. 51,558,611ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි කාලයේදී මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02ක් විසින් මිලදී ගෙන තිබූ රු.237,400ක වූ පරිගනකවල වටිනාකම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකර පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදලෙන් ගැලපීමට පියවර ගනු ලබන බව. | පරිගනකවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස දැක්වීමට පියවර ගතයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 02කට පරිත්‍යාග කර තිබූ ලැප්ටොප් පරිගනක 03ක වටිනාකම රු.521,557ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි කාලයේදී මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |
| (ඈ) | උඩෙයියාර්කට්ටු ගොවිජන සේවා කාරක සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට කාන්තා ගොවි සංවිධාන ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය රු. 776,928ක් මූල්‍ය ප්‍රකාශනවල රු.284,488ක් ලෙස දැක්වීමෙන් රු.492,440ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වර්ෂයේ සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය සහිතව ගිණුම් වාර්තාවේ නිවැරදි කරනු ලබන බව. | වෙනසට හේතු විමසීම් කර නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |

### 1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03ක සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ට්‍රැක්ටර් 02ක්, ගෙවීම් 07ක් සහ ලැබිය යුතු කුලී ආදියෙහි එකතුව රු.6,188,638ක් තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීමෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරි කාලයේදී මේවා ලබාගෙන විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලබන බව. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළයුතුය. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීතී, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 109(i) | ගොවිජන සේවා කාරක සභා 03ක ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පැවැති රු.2,622,002ක ලැබිය යුතු ට්‍රැක්ටර් කුලී ශේෂය විධිමත් පරීක්ෂා කිරීමකින් තොරව ගොවිජන සංවර්ධන සහකාර කොමාසාරිස්වරයා විසින් පොත්වලින් කපාහැර තිබුණි. | අදාල මුදල සමුච්චිත අරමුදලට තාවකාලිකව මාරුකර නිවැරදි කර ඇති බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට පියවර ගැනීම හෝ විධිමත් පරික්ෂාවකින් පසුව අයකර ගත නොහැකි ශේෂ විධිමත් අනුමැතිය යටතේ කපා හැරීම කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 9.1 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 05ක් විසින් මුදල්, චෙක්පත් හා ගබඩා භාර කටයුතුවල නිරත නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදල් ගෙවීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 11ක මෙහෙයුම් ප්‍රතිඵල රු. 802,781ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,137,645 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලවල රු. 8,334,864 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10ක සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දීර්ඝ කාලයක සිට දක්වා තිබූ ලැබිය යුතු ශේෂ රු. 2,793,211ක් සහ රු.10,275,795 ක ගෙවිය යුතු ශේෂ පසුගිය වර්ෂ 01 සිට 11ක් දක්වා කාලයක් අයකර ගැනීමට හා ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට පියවර ගෙන ඇති බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට සහ ගෙවිය යුතු මුදල් ගෙවා නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | සම්පත්නුවර ගොවිජන සේවා කාරක සභාවේ 2016 වර්ෂයේ මිලදී ගෙන තිබූ ඡායා පිටපත් යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ දෙවතාවක් රු.135,900ක් වැයකර අළුත්වැඩියා කිරීමෙන් පසුව මාස 03ක් ඇතුළත භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී තිබීමෙන් මේ සඳහා වැයකළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මීයන් හානි කර අළුත්වැඩියා කිරීමෙන් පසු නැවත හානි කර අළුත්වැඩියා කරන ලද බව. | වත්කම්වල ආරක්ෂාව සඳහා ආරක්ෂිත ක්‍රමවේද භාවිතා කළයුතුය අතර ඵලදායීතාවය පිළිබඳ අවධානය යොමුකර අළුත්වැඩියා කටයුතු සිදුකළ යුතුය. |

**3.2 අරමුණුගත කාර්යය සඳහා අරමුදල් උපයෝජනය නොකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 09ක ගොවි සංවිධානවල ගොවීන්ගේ දරුවන්ගෙන් පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූවන්ට ත්‍යාග පිරිනැමීම සඳහා විවිධ පාර්ශවයන්ගෙන් රැස්කර තිබූ රු. 2,198,164ක් පසුගිය වර්ෂ 02ක සිට 08ක් දක්වා කාලයක් අදාල සිසුන්ට ලබා දීමට කටයුතු කිරීමෙන් තොරව රඳවා ගෙන තිබුණි. | ලබාදීමට කටයුතු කරනු ලබන බව. | අරමුදල් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.3 වත්කම් උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උඩෙයියාර් කට්ටු ගොවිජන සේවා කාරක සභාවේ 2021 වර්ෂයේ රු. 1,340,730ක පිරිවැයකින් ඉදි කළ වී ගබඩාව වර්ෂයකට අධික කාලයක සිට අදාල අරමුණු සඳහා භාවිතා නොකර අතහැර දමා තිබුණි. | වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී නොගැනීම මෙයට හේතු වී තිබූ බව. | අභාවිත වත්කම් භාවිතා කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 10කට ලබාදී තිබූ ට්‍රැක්ටර් 106ක් අළුත්වැඩියා කිරීමට පසුගිය වර්ෂ 04 සිට 07ක් දක්වා කාලයක් ක්‍රියාමාර්ග නොගෙන වාහන අංගනයේ රඳවා තිබුණි. | කටයුතු කරමින් පවතින බව. | -එම- |
| (ඇ) | 2019 ජුනි 19 දින බදුකරුවකුගෙන් ආපසු ලබාගත් ට්‍රැක්ටරයක් සමාලෝචිත වර්ෂය අවසාන දක්වා භාවිතා නොකර වාහන අංගනයේ රඳවා තිබුණි. | වෙනත් ගොවියෙකුට මාරුකර ලබාදෙනු ලබන බව. | -එම- |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුලතිව් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා සහ ඔලුමඩු ගොවි සංවිධානය අතර වැව් ප්‍රතිසංස්කරණ කාර්යය සඳහා රු.4,814,412ක මුදලක් යටතේ එළඹි ගිවිසුම් ප්‍රකාරව 2023 දෙසැම්බර් 11 දින අදාල කාර්යය නිමකළ යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගොවි සංවිධානය විසින් එම කටයුතු අවසන් කර නොතිබුණි. | වර්ෂාව හේතුවෙන් කාර්යයන් අවසන් කිරීමට නොහැකි වූ බව. | අදාල කාර්යය සම්පූර්ණ කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08ක ගොවිජන සංවර්ධන නිලධාරී සහ ගොවි සංවිධාන කාරක සභා ලේකම් තනතුරු පසුගිය වර්ෂ 01 සිට 08ක් දක්වා කාලයක් පුරප්පාඩුව පවතින අතර එම තනතුරු සඳහා විධිමත් අනුමැතියකින් තොරව මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර / සංවර්ධන නිලධාරී තනතුරේ සේවය කළ නිලධාරීන් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වරයා විසින් එම පුරප්පාඩු සඳහා පත්කර තිබුණි. | සහකාර කොමසාරිස් වරයා සමග සාකච්ඡා කර මේ සඳහා ක්‍රියාමාර්ග ගනු ලබන බව. | විධිමත් ක්‍රමවේදයක් යටතේ පත්වීම් ලබා දිය යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනැති අංක 02/2020 දරන ගොවිජන සංවර්ධන චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව, ආදායම් නිසි පරිදි හඳුනාගෙන තක්සේරු කර සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | ඉදිරි කාලයේදී නිවැරදි කරනු ලබන බව. | චක්‍රලේඛයට අනුව ඇස්තමේන්තුව සකස් කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු 2030 වර්ෂයේ ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා විසින් වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළයුතු දෑ සහ එහි ප්‍රගතිය මැනීමේ දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට ආදිය පසුගිය වර්ෂ 06ක සිට පියවර ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලබන බව. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා දර්ශකයන් හඳුනාගෙන වාර්ෂික ප්‍රගතිය මැනීම සඳහා පියවර ගතයුතුය. |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන කාරක සභා 11ක ගොවිජන බැංකු විසින් ගොවීන්ට ලබාදුන් ණය මුදලින් රු.2,955,632ක් පසුගිය වර්ෂ 01 සිට 11ක් දක්වා අයකර ගෙන නොතිබුණි. | හිඟණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟමුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය. |
| (ආ) | උඩෙයියාර් කට්ටු ගොවිජන කාරක සභාවේ රු.3,533,979 ක් වටිනා ගොවිජන බැංකු ගිණුම් 5,731ක් වර්ෂ 02කට අධික කාලයක් අක්‍රිය බැංකු ගිණුම් ලෙස පැවැතුණි. | මෙම වර්ෂයේ සියළුම ගිණුම් ක්‍රියාත්මක කරනු ලබන බව. | අක්‍රිය බැංකු ගිණුම් සක්‍රීයව පවත්වා ගැනීමට ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. |

## 6. පද්ධති හා පාලන

### 6.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 11ක් සම්බන්ධයෙන් මෙහෙයුම්, මුදල් රෙගුලාසි 133 සහ 134 ප්‍රකාරව, අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදු කිරීමට ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් පසුගිය වර්ෂ 10කට අධික කාලයක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගතයුතුය. |